සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 1

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

පැය තුනයි

අතිරේක කියවීම් කාලය - මිනිත්තු 10යි.

- I කොටසේ ප්‍රශ්නය ද, II වන කොටසින් තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සැ. යු. :- I කොටසේ ප්‍රශ්නයට පිළිතුරු මෙම පත්‍රයේ ම ලියා II කොටසේ පිළිතුරු ප්‍රත්‍යේකයේ ලියා භාර දෙන්න.

Deputy Commissioner of E...
Confidential Unit
Department of Examina...
Pelawatta, Bat...

විභාග අංකය .....

I කොටස

1. (i) ධර්මයෙහි සඳහන් වන සැප දෙක නම් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ii) ස්කන්ධ පංචකයෙන් හතරක් නම් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(iii) "අථවෝ භගවා රත්තියා පඨමං යාමං පටිච්චසමුප්පාදං අනුලෝමපටිලෝමං මනසාකාසි" පටිච්චසමුප්පාද ධර්මය මෙනෙහි කිරීමේදී බුදුරජාණන් වහන්සේ අනුගමනය කළ නය ක්‍රම දෙක දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(iv) ලෝකය ශූන්‍ය වශයෙන් බලන ලෙස බුදුරජාණන් වහන්සේ වදාළ දෙදෙනෙකුගේ නම් සඳහන් කරන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

(v) සම්මා දිට්ඨිය ඇති කර ගැනීම සඳහා ඉවහල්වන කරුණු දෙක දක්වන්න. *(ලකුණු 02 යි)*

(අ) .....

(ආ) .....

[දෙවැනි පිටුව බලන්න.

Past Papers Wiki

(vi) ඔඝායතන නම් වශයෙන් දක්වන්න. *(ලකුණු 04 යි)*

.....

.....

.....

.....

.....

.....

(vii) කර්ම දේශනාවේ දී වදාළ නියාම ධර්ම හතරක් ලියන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(viii) සමථ භාවනාවට අයත් අනුස්සති ධර්ම හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(ix) සිව් පිරිසිදු සීලයන් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(අ) .....

(ආ) .....

(ඉ) .....

(ඊ) .....

(x) පහත සඳහන් ගාථාව සම්පූර්ණ කරන්න. *(ලකුණු 02 යි)*

න තං කම්මං කතං සාධු

.....

.....

.....

* *

Past Papers Wiki

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

2568 - බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

S 1

(01) ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම්

● ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

II කොටස

1. (i) නිර්වාණය ද නිර්වාණගාමී මාර්ගය ද මෙලොවදී ම ප්‍රත්‍යක්ෂ කර ගත හැකි ධර්ම සංකල්පයේ නම් ලියන්න. *(ලකුණු 04 යි)*

(ii) එම සංකල්පය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කෘත්‍ය හතරක් ධර්මයේ දක්වයි. ඒවා සිංහලෙන් හෝ පාලියෙන් දක්වන්න. *(ලකුණු 06 යි)*

(iii) යහපත් දිවිපැවැත්මක් සඳහා දේශනා කර ඇති මාර්ගාංගය නම් කරන්න. *(ලකුණු 08 යි)*

2. (i) පුද්ගලයාගේ විවිධ හැසිරීම් ස්වභාවයන් අනුව චරිත වර්ග හයක් බුදුසමයේ දක්නට ලැබෙයි. එම චරිත වර්ගයන්ගෙන් හතරක් දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) ඔබ නම් කර ඇති එම චරිත වර්ගයන්ගේ ලක්ෂණ හා ඒවාට ගැලපෙන භාවනා විධි කවරේ දැ යි පෙන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) ආධ්‍යාත්මික වශයෙන් හා ලෞකික වශයෙන් සමථ භාවනාවෙන් ලද හැකි ප්‍රතිඵල කවරේ දැ යි විමසීමට ලක් කරන්න. *(ලකුණු 08 යි)*

3. (i) බුදුරජාණන් වහන්සේ දවස පැවති හේතුඵලවාදී ඉගැන්වීම් සතර ආකාරයකට බෙදා විවරණය කොට උන්වහන්සේ විසින් ප්‍රතික්ෂේප කරන ලදී. එම බෙදීම් හතර දක්වන්න. *(ලකුණු 04 යි)*

(ii) පටිච්ච සමුප්පාදය විස්තර කිරීමට උපයෝගී කරගනු ලබන තථ, අවිතථ, අනඤ්ඤථා හා ඉදප්පච්චයතා සංකල්පවල අදහස් කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) (අ) ද්වාදසාංග පටිච්ච සමුප්පාදය පිළිවෙළින් නම් කරන්න.

(ආ) 'ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්මිං සති ඉදං න හෝති' මෙමගින් පටිච්චසමුප්පාදයේ මූලික ධර්මතා දෙක පෙන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

4. (i) නිවන දුක්ඛ නිරෝධ ආර්ය සත්‍ය ලෙස හැඳින්වීමේ හේතුව ඉදිරිපත් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) නිවනෙහි සෝපාධිසේස අනුපාධිසේස යන වර්ගීකරණය කෙටියෙන් පැහැදිලි කරන්න. *(ලකුණු 06 යි)*

(iii) නිවන අවබෝධ කර ගැනීමට අනුගමනය කළ යුතු ත්‍රි ශික්ෂා මාර්ගය පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

5. (i) භාරතීය කර්ම සංකල්පයේ විකාශනය පිළිබඳව අවස්ථා හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) අංගුත්තර නිකායේ නිබ්බේධික (පරියාය) සූත්‍රයේ කර්මය විපාක දෙන කාල තුනක් දේශනා කොට ඇත. එම කර්ම තුන දක්වා හඳුන්වා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) 'චේතනාවට මුල්තැන දී කර්මය විවරණය කිරීම බෞද්ධ කර්මවාදයේ විශේෂ ලක්ෂණය වේ' හේතු දක්වන්න. *(ලකුණු 08 යි)*

මෙතැනින් වෙන් කරන්න.

[හතරවැනි පිටුව බලන්න.

6. (i) (අ) ඇත්ත ඇති සැටියෙන් දැකීම (යථා භූතඤාණදස්සන) සඳහා පාදක වන සිද්ධාන්තයේ නම ලියන්න.
(ආ) ඊට අයත් ප්‍රභේද නම් කරන්න. *(ලකුණු 04 යි)*

(ii) ලෝකය යන පදය බුදුදහමෙහි විග්‍රහ කර ඇත්තේ කවර ආකාරයෙන් දැ යි පහදා දෙන්න. *(ලකුණු 06 යි)*

(iii) 'සබ්බේ සංඛාරා අනිච්චා'
සංස්කාරවල ස්වභාවය වෙනස් වීමයි. කෙටි විවරණයක් මගින් එම ස්වභාවය හඳුන්වා දෙන්න. *(ලකුණු 08 යි)*

7. (i) කුසලාකුසල විනිශ්චය කිරීමේ නිර්ණායක තුනක් අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේ දක්වා ඇත. එම නිර්ණායක තුන නම් කරන්න. *(ලකුණු 03 යි)*

(ii) එම නිර්ණායකයන්ට අනුව ප්‍රත්‍යවේක්ෂා ක්‍රියාවලිය තුන් දොරටුවට සම්බන්ධ කර ගන්නේ කෙසේ දැ යි පෙන්වා දෙන්න. *(ලකුණු 07 යි)*

(iii) අකුසල (නරක හැසිරීම) බැහැර කර කුසලය (හොඳ හැසිරීම) සංවර්ධනය කිරීමෙන් පුද්ගල හා සමාජ යහපත සලසා ගත හැකි බව පහදා දෙන්න. *(ලකුණු 08 යි)*

* * *

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library